පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 6

අවසාන වාර පරීක්ෂණය - 2018

පාසලේ නම : .....

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : .....
.....

කාලය : පැය 02 යි.

භූගෝල විද්‍යාව I, II

භූගෝල විද්‍යාව I

සැලකිය යුතුයි :

❖ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය ලෙස ..... හැඳින්විය හැක.

(දිස්ත්‍රික්කය, පළාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)

02. මොණරාගල දිස්ත්‍රික්කය ..... පළාතේ පිහිටා ඇත.

(දකුණු, සබරගමුව, ඌව)

03. වගාවට හානි කරන ගොළුබෙල්ලන් විනාශ කරන සතෙක් ලෙස ..... හැඳින්විය හැක.

(බත් කුරා, ගැඩවිල් පණුවා, ඇටි කුකුළා)

04. ගම්මිරිස් වගා කරනු ලබන්නේ ..... කලාපයේ ය.

(වියළි, කඳුකර, තෙත්)

05. ..... ක්‍රිස්තියානි ආගමේ සංකේතය වේ.

(ධර්ම චක්‍රය, කුරුසය, 'ඕම්' ලකුණ)

Education NCP - www.edncp.lk

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් "නි" වටා ද වැරදි නම් "වැ" වටා ද රවුමක් අඳින්න.**

06. අම්බලන්ගොඩ, වෙස් මුහුණු සෑදීමේ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි. (නි වැ)

07. ගංගාවල අසීමිත ලෙස වැලි ගොඩ දැමීම නිසා පරිසරයේ විවිධ ගැටළු ඇති විය හැක. (නි වැ)

08. සංස්කෘතික වශයෙන් වැදගත් වන කෝනේශ්වරම් කෝවිල පිහිටා ඇත්තේ කොළඹ වරාය ආසන්නයේ ය. (නි වැ)

09. නිවැරදි දිශාව හඳුනාගැනීමට මාලිමා යන්ත්‍රය භාවිතා කෙරේ. (නි වැ)

10. කාලගුණික අංගයක් වන උෂ්ණත්වය මනිනු ලබන්නේ මිලිමීටර් වලිනි. (නි වැ)

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු නිවැරදි පිළිතුර හිස්තැන් මත ලියන්න.**

11. ජපානය ..... සාගරයේ පිහිටා ඇති දූපතකි.

12. හිරු උදාවන දිශාවට මුහුණලා සිටගත් විට ඔබේ දකුණු අත විහිදෙන දිශාව ..... දිශාව වේ.

13. සුළඟේ වේගය මැනීමට ..... භාවිතා කෙරේ.

14. මුළුතැන්ගෙයි ඉවතලන ද්‍රව්‍ය දමා ..... පොහොර සකස් කරගැනීම පරිසර හිතකාමී ක්‍රියාවලියකි.

15. වායුගෝලයේ පවත්නා ..... වායුව, ශාඛ වර්ධනයට අවශ්‍ය වේ.

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

16. වායු දූෂණය නිසා ශ්වසන පද්ධතිය ආශ්‍රිතව වැළඳෙන රෝගයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) කැස්ස (2) අධික රුධිර පීඩනය
(3) දියවැඩියාව (4) ආමාශ පිළිකා

17. ශ්‍රී ලංකාව අයත් වන මහද්වීපය වන්නේ,
(1) අප්‍රිකා මහද්වීපය (2) ආසියා මහද්වීපය
(3) දකුණු ඇමරිකා මහද්වීපය (4) යුරෝපා මහද්වීපය

18. මහනුවර අපේ රටේ පිහිටි දියුණු නගරයකි. එහි පිහිටා ඇති පූජනීය ස්ථානයකි.
(1) රුවන්වැලි සෑය (2) ශ්‍රී මහා බෝධිය
(3) දළදා මාලිගය (4) කිරි වෙහෙර

Education NCP - www.edncp.lk

19. භූගෝලීය ලක්ෂණ වල ස්වභාවික භූ ලක්ෂණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) උස් බිම් (2) මාර්ග

(3) ක්‍රීඩා පිටි (4) ගොඩනැගිලි

20. මෑත දී ඉදි වූ අන්තර් ජාතික ගුවන් තොටුපල පිහිටා ඇත්තේ,

(1) කටුනායක ය. (2) මත්තල ය.

(3) රත්මලානේ ය. (4) පලාලි වලය.

***

භූගෝල විද්‍යාව II

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සිතියම ඇසුරින් පිළිතුරු සපයන්න.



(i) ගංගා නම් ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii) බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii) බටහිර ගාට්ස් කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv) පෝක් සමුද්‍ර සන්ධිය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v) අරාබි මුහුදු දැක්වෙන අක්ෂරය කුමක් ද?

(vi) ඉන්දියාව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 12)

Education NCP - www.edncp.lk

02. (i) උතුරු මැද පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) දිශා 8 ඇඳ නම් කරන්න. (ලකුණු 04)

(iii) (අ) කාලගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

(ආ) කාලගුණික අංග තුනක් ලියන්න. (ලකුණු 03)

03. (i) අප අවට වටපිටාවේ දැකිය හැකි භූගෝලීය ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(ii) පහත සතුන්ගෙන් පරිසරයට ඇතිවන ප්‍රයෝජන එක බැගින් ලියන්න.

- ගිරවා
- වවුලා
- ගෑඩවිල් පණුවා
- බත් කුරා

(ලකුණු 04)

(iii) ශාක වලින් ඇති ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

04. (i) (අ) ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) ඔවුන් අදහන ආගම් වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) මිනිසා ජාති, ආගම් හේතු නොතකා අන්‍යෝන්‍ය සහජීවනයෙන් කටයුතු කරන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) ඔබ කැමති ආගම් දෙකක ආගමික උත්සව දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

05. (i) කෘෂි කාර්මික භූමි පරිභෝගය යටතේ ශ්‍රී ලංකාවේ සිදු කරන ආර්ථික කටයුතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(ii) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වූ කර්මාන්ත මුල් කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

කර්මාන්තය	ප්‍රදේශය
• ලී බඩු	.....
• වෙස් මුහුණු	.....
• පැදුරු	.....
• පිත්තල භාණ්ඩ	.....

(ලකුණු 04)

(iii) ඔබ භුක්ති විඳින සේවා හතරක් ලියන්න. (ලකුණු 04)

06. (i) භූමිය ප්‍රයෝජනයට ගන්නා ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

(ii) අවිධිමත් ලෙස භූමිය පරිහරණය කිරීමෙන් ඇති වන ප්‍රතිඵල හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) (අ) වායු දූෂණය වන ආකාර දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) වායු දූෂණයෙන් ශ්වසන පද්ධතිය ආශ්‍රිතව ඇති වන රෝග දෙකක් ලියන්න. (ලකුණු 02)

07. (i) බලශක්ති වල මූලික ප්‍රභවය වන්නේ කුමක්ද? (ලකුණු 02)

(ii) බලශක්ති ඉල්ලුම ඉහළ යාමට බලපාන හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) නිවසේ දී බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිතා කළ හැකි අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 06)

***

Education NCP - www.edncp.lk